# මායා මාවත

## ඩැන්ඩිනොං කඳුවැටියෙන් බැස එන නත්තල

ස්භාව සෞන්දර්යය නැරඹීම හා එහි සැරිසැරීම චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගැනීමට මහත් අනුබලයකි. සොබා දහම අපට ගැඹර ජීවන දර්ශනයක් ද පෙන්නුම් කරයි. තපස්හු තපස් රකිනු වස් වනගත කඳු පර්වත සොයා යති. මෙය ජීවිතයෙන් පලා යෑමක් නො ව ජීවිතය සොයා යෑමකි. හිමාල කඳුකරය වෙත තපස්වීන් හා ඉසිවරුන් පිවිසෙන එක් මාර්ගයක් වැටී ඇතේත් කඳුකර නිගමක් වන සෘෂිකේශී ඔස්සේ ය. ගංගා නම් නදිය හිමවු කුළු අතරින් බේරී සමබිමකට පළමු ව පතිත වනනේ සෘෂිකේශිහි දී ය. ගඟ ඉස්මත්තේ හිම කඳු පසුබිමකි. ගඟ දෑලේ ආශ්‍රමවලින් වේද මතුරු ගී ගයනු නිතර නිතර ඇසේ. මේ කඳුකර නිගම රමණීය පියසෙකි. සෘෂිකේශිහි ස්වර්ග ශ්‍රම් වනෝද්‍යානය ඔස්සේ හිමාල අඩවියේ මබිරිය සමඟ පා ගමනක යෑමට එදවස මට අවස්ථාව ලබිණි. එය ස්වභාව ධර්මයේ අපූරු නිර්මාණයක් වන කඳුකරයේ චමත්කාරය සිත් සේ රස විඳි අවස්ථාවකි. කඳුකරය හැම දා මත් මට කවියක් ම විය.

නොබෝ දා තවත් කඳුකර ගමනක යෙදීමට මට හැකි විය. මේ ගමනේ කෙළවර හමු වූයේ මොන්බල්ක් –(Monbulk) නමැති පිටිසර ගම්මානය යි. මේ කඳුකර නිම පිහිටා ඇත්තේ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර සිට කිලෝමීටර් 55ක් පමණ ඈතින් ය. මොන්බල්ක් –(Monbulk) ගම්මානය ඩැන්ඩිනොන් (Dandenong) කඳු යායේ නැගෙනහිර බෑවුමේ පිහිටි රමණීය බිම් පෙදෙසකි. මෙල්බර්නය තෙමා බසින යාරා (Yarra) නදිය මේ ගම් පියසට ඔබ්බෙන් ගලා බසී. මා නිවාඩුවක් ගත කරන රෝවිල් නිගමේ සිට මොන්බල්ක් කඳුකරය වෙත ඇදී යන මඟ මහා වන බිමක් මැදින් වැටී ඇත. කඳු මතට නැගුණු කල්හි ගොවිබිම්වලින් වැසී ගිය පිටිසරබද පෙදෙස් ඈත නිම්නයේ තැන තැන දිස්වේ.

තුරු ගොමුවෙන් වට පිටිසරබද නිවෙස් අසල සුපිරි කුසුමෙන් බබළන ගෙඋයන මවන්නේ අමුතු ම සිරියාවකි. ගොවිපළ දසුන ද කඳුකර සොබා සිරිය වර්ණවත් කරන විසිතුරු සිතුවමක් බඳු ය. එය හරිත වර්ණ නිම්නය පසුබිම් කර ඇඳි දියසායමේ බොඳ වූවක් සේය. මොන්බල්ක් නිගම 1893 දී පමණ මොන්බල්ක් ස්වාභාවික වන බිමට අයත් පෙදෙසින් කොටසක් වෙන් කිරීමෙන් ඇති වූවකි. ගොවිපළ ගහන පෙදෙසක් ලෙස මෙය සුපතළ ය.

නන් විසිතුරු සියොතුන් නද ඇසෙන සුපිපි කුසුමින් බර ගෙඋයනින් සැදි මනරම් මොන්බල්ක් ගම්මානයේ දී මා දුටු නත්තල් සිරිය මගේ අතීත නත්තල් මතකය සිහි කරන්නක් විය.

පිටිසර දේවස්ථාන බිමේ නත්තල් පොළකි. ගම් වැසියෝ පවුල් පිටින් එහි ඇදී එති. දේවස්ථානය තුළ පැරණි කැරොල් ගී ගායනා හඬ රැව් දෙයි. මහලු මහිලාවෝ තාලානුව හිස වනමින් ගී ගායනයේ යෙදෙති. අසල බිමෙක නත්තල් පවුල් හමුවකි. එය කුඩා දරුවන්ට මහත් ආස්වාදයක් දෙන සැණකෙළියක් බඳු ය. මුහුණ පාට කර විකාර රූපී රංගනයක යෙදෙන කාන්තාව ළමයින් ඉදිරියේ කවටකම් පායි. ඇය නාඩගමක බම්මන්නා සිහි කරවයි. මොන්බල්ක්හි කුටුම්බයට උදාව ඇත්තේ ප්‍රීතිමත් නත්තලකි. පවුලක පවතින සාමූහිකත්වය හා සමගිය නත්තල මිහිරක් කර ගත් ගම්බද මොන්බල්ක් පවුලෙන් මූර්තිමත් වෙයි. සාම්ප්‍රදායික ඕස්ට්‍රේලියානු කුටුම්බය යනුවෙන් හඳුන්වන්නේ පවුලේ වාසස්ථානය යි. සැමියා ද, බිරිය ද, දරුවෝ ද එයට අයත් වූහ. සාම්ප්‍රදායික කුටුම්බය, අවිච්ඡින්න ව සාරධර්ම පරපුර ද පවත්වා

ගෙන නයෑමට රුකුලක් වෙයි. මෙල්බර්නයේ සෙසු ප්‍රදේශවල දැකිය හැකි බහුවාර්ගික ජන සංයුතිය මෙහි දක්නට නො ලැබේ. හුදෙකලා ගෙවිබිම්වලට හා ගමට සීමා වූ සුදු ඕස්ට්‍රේලියානු ජාතිකයෝ මේ ගම් වැසියෝ වෙති.

කඳුකර පිටිසර බද ගම්මානයේ කුඩා දේවස්ථානයක මෙන් ම කැරොල් ගීත කණ්ඩායම ද සෞන්දර්ය සපිරි අතීත ආවර්ජනයකට මා යොමු කරවන්නක් විය.

මා කුඩා කල හැදුණ වැඩුණ පාමංකඩ හා කිරිල්ලපොන ප්‍රදේශ බද ජනතාවට නත්තල මහ නුවන් පුබුදන අසිරිමත් එකක් විය. නත්තල් ජනේරු අතර කාලය තුළ ගෙන් ගෙට ගිය පාමංකඩ යොමුන් නළු කණ්ඩායම ගැයූ බයිලා ගායනය මතකයේ රැව් නැගෙයි.

''නත්තල් ජනෝරු මෙදා

ළං වෙන සීරූ

කොහොම කොහොම පසු කරමු ද

මෙදා ජනෝරූ''

මොන්බල්ක් (Monnblk) පිටිසර දේවස්ථාන දසුන මට සිහිපත් කළේ කෙත්යාය මැද එදවස සුදෝ සුදුවෙන් බැබළුණ රඹුක්කන බෙලිගොඩපිටිය දේවස්ථානය යි. වතුගල පාමුල ඈතින් දිසි කෑගලු කඳුයාය පසුබිම් කර පිහිටි මේ ක්‍රිස්තියානි දේවස්ථානය බැප්ටිස්ට් සංගමයට අයත් වූවකි.

එදවස බිරිය හා දූදරුවන් සමග නත්තල් නිවාඩුවට රඹුක්කන නිගම් දොර බලා දුම්රියෙන් ගිය ගමන අප කුටුම්බයට මහත් ආස්වාදජනක එකක් විය. රාත්‍රි කාලයේ ලියදිවට වෙල් එළි මැදින් ලන්තෑරුම් හා පැට්රොල් මැක්ස් ලාම්පු එළියෙන් මඟ සොයාගෙන ගම ගෙදරට පැමිණි දේවස්ථාන කැරොල් ගී කණ්ඩායම ගෙන දුන්නේ අපූරු වින්දනයකි. මේ කැරොල් ගීයෙන් මතු වුණ මධුරත්වයේ දෝංකාරය අවට කඳුවල වැදී රැව් පිළිරැව් නැගෙන්නක් විය. බෙලිගෙ ාඩ පිටිය බැප්ටිස්ට් දේවස්ථානයට වසර 150ක පමණ ඉතිහාසයක් ඇත. මේ කැරෙල් ගී සම්ප්‍රදාය ද අනාදිමත් කාලයක සිට අවිච්ඡින්න ව පැවත එන්නකි. මෙහි දී ගායනා කරන බොහෝමයක් කැරොල් ගීත ගමේ වියතුන් වු ගුරුන්නාන්සේලා ගේ නිර්මණයෝ ය.

ජොහාන් ගුරුන්නාන්සේ නමැති ගැමි පබඳුවෙක් ස්වතන්ත්‍ර තනු නිර්මාණය කර පබැඳි අර්ථාන්විත ගීත සම්ප්‍රදායික කැරොල් ගීයට එක් වුණු අපූරු ගීතාවලියක් ලෙස දැක්විය හැකිය.

*"බිළිඳෙක් හඬන්නේ*
*කිම දෝ මෙදිනේ*
*මිහිරි මිහිරි ඒ නදා*
*ගව ඔරුවේ තණ රොඩු මතා*
*මව් මරි තුරුලේ සැතපෙනා"*

ඉහත ගී ඛණ්ඩය ජොහාන් ගුරුන්නාන්සේ ගේ මධුර ගී තනුවකට බැඳුණු රචනාවකින් උපුටා ගනු ලැබුවකි.

නත්තල් කැරොල් ගීතාවලියට ගීත කීපයක් එක් කිරීමට මට ද අවස්ථාව ලැබිණි. ඇතැම් කැරොල් ගීත ගායනා කෙරුණේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සංවිධානය කළ නත්තල් කැරොල් ගීත ගානා සඳහා ය.

පාරුවල නැගී නත්තල් කැරොල් ගී ගයමින් තොටළඟ සිට මීගමුව බලා ගිය කැරොල් කණ්ඩායමේ ගී ඇසීම (හැමිල්ටන් ඇළ දිගේ) ඇළ දෙපස රැස් වූවන්ට මහත් ආස්වාදයක් ගෙන දෙන්නක් විය. මීගමුව මුන්නක්කරයෙන් අවසන් වු පාරු කැරොල් ගී ගායනය මීගමු නගරයේ වෙරළාසන්නයේ පැවති කැරොල් ගී ප්‍රසංගයේ දී ද අතිමහත් ජන සමූහයක් හමුවේ ද ගායනා කෙරිණි. මෙහි දී ගායනා කළ ගීත වැඩි සංඛ්‍යාවක තනු නිර්මාණය කළේ සංගීතවේදි ෂෙල්ටන් ප්‍රේමරත්න මහතා ය. ෂෙල්ටන් ප්‍රේමරත්න මහතා තනු නිර්මාණය කල බාලොලි බා ලොලියේ නැළවිලි ගීතය, (ලතා වල්පලාළ මහත්මිය ගායනා කළ) පසු කාලයේ ක්‍රිස්තියානි ගීත පොතට ද ඇතුළත්ව තිබීම වෙසෙසින් වැදගත් කොට සලකමි.

බෙත්ලෙහෙමේ ගීතය:

*බා ලොලි බා ලොලියේ*
*බා ලොලි බා ලොලියේ*

*මිනිස් වෙසින් ආ-විමක්තියේ හඬ*
*මරිය මවුන් නැළවිල්ලට මුසු වෙත*
*ස්වර්ග රාජ්‍යයේ-දොරගුළු ඇරලන*
*දෙව් බිලිඳෙක්-ගවලෙන් ගැබ ඉපදිණ*

*දෑත දෙපය දැඩි-යදම් බඳින ලද*
*දුක්බර වූ ජනතාව අවදි කොට*
*දේව දයා සම කරුණා උල්පත*
*සීත රැයේ-බෙත්ලෙහෙමෙන් මතුවිණ*

*පාප අඳුර සන්-තාප ඉවත ලන*
*නව චින්තනයට-මාවත හෙළ කළ*
*රුවන් තාරකා-එළියක් එක ලෙස*
*අහස් තලේ හිඳ-බැලුම් හෙළා ඇත*

ගායනය: ලතා වල්පොල

තනුව: ෂෙල්ටන් ප්‍රේමරත්න

පබැඳුම: සුනිල් සරත් පෙරේරා

සුනිල් සාන්ත මහතා එදවස පදිංචිව සිටියේ ජාඇලට නුදුරු දෙනියාගාත ග්‍රාමයේ ය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඉදිරිපත් කළ කැරොල් ගී ප්‍රසංගය සඳහා තනුවක් නිර්මාණය කිරීමට සුනිල් සාන්ත මහතා කැමති වූයේ මගේ බලවත් ඉල්ලීම අනුව ය. මවිසින් ලියන ලද ඒ ගීතය ගායනා කරනු ලැබුවේ සංගීතවේදී අයිවෝ ඩෙනිස් මහතා විසිනි.

නත්තල:

*ජේසු උපන් දා සිහියට නංගා*
*අහස කුලේ මිණි පානක් නැංගා*
*රහස දනී දෝ ලෝකය මන්දා*
*නත්තල මේ එනවා*

*සක් හඬ සත්සර නැංවෙන නත්තල*
*ගී නද මිහිරට රැව්දෙන නත්තල*
*සාමය දානය බෝවෙන නත්තල*
*සක්වළ පව්වෙහි දීස් වෙනවා*

*නත්තල නත්තල-සෙත් පිරි නත්තල*
*පින්බර සුන්දර-සන්හිඳි නත්තල*
*නත්තල ගෙන් ගෙට එනවා*

*සාමය කැන්දා මෙත්දද නංවා*
*සවිලෝ සත්හට සෙත්සිරි රන්දා*
*ගහවැළ මල් ලා සෙත්සිරි බන්දා*
*නත්තල මේ එනවා*

තනුව: සුනිල් සාන්ත

ගායනය: අයිවෝ ඩෙනිස්

පද රචනය: සුනිල් සරත් පෙරේරා

නත්තල තේමා කර මවිසින් රචනා කරන ලද ගීත බොහෝ ගණනක් ඇත. ඇතැම් ගීතවල සම්පූර්ණ වචන මා ළඟ නැත.

සීතල හිම පතිත කඳුවැටි පසු කර රක්ත වර්ණයෙන් සැරසී නත්තල් සමයේ පැමිණෙන නත්තල් සීයා පිළිබඳ ව කියවෙන අයිවෝ ඩෙනිස් ගායන් කරන:

*"සීතල හිම කඳු වැටියෙන් බැසගෙන*
*සම්පත සැනසුම සතුට බෙදා ගෙන*
*සුමියුරු සීනු නදින් මන බැඳලන*
*ගෙන් ගෙට කවරු ද මේ එන්නේ"*
ගීතය ද

අමරා රණතුංග ගායනා කරන:

*"බාලොලි ලොලි-බාලොලි ලොලි*

*නැළවිල්ලෙන් නිදන්න දෙව් පුත*

*රන්වන් රන් පහන් තරුව පායලා ඇත"*

ගීතය ද මවිසින් රචනා කළ ගීතය.

කඩවත බැප්ටිස්ට් දේවස්තානය 1968 දී පමණ සංවිධානය කළ නත්තල් කැරොල් ගීත ප්‍රසංගය ද අතීත ස්මෘතියේ පවතින අපූරු අත්දැකීමකි. එවකට දේවස්ථානය බාරව සිටි රොහාන් විජේසිංහ දේවගැතිතුමා ගේ මඟ පෙන්වීමත්, මිල්ටන් ඉලංගතිලක මහතාගේ ආරාධනයත් අනුව මේ සඳහා අලුත් ගීත නිර්මාණය කිරීමට නාරද දිසාසේකර මහතාටත් මටත් අවස්ථාව ලැබිණි. සාම්ප්‍රදායික කැරොල් ගීතයේ විවිධ ලක්ෂණ සේවනය කරමින් කැරොල් ගීතය පිළිබඳ ව අත්හදා බැලීම් කීපයක් ම කිරීමට නාරද දිසාසේකර මහතාටත් මටත් මෙහි දී අවස්ථාව ලැබිණි.

අමරා ගුණතුංග මහත්මිය ගායනා කරන:

*"වලා ගැබ පිපි තාරකා මල්*
*ලකුණ ගැන කී පඬිදු බස ලෙස*
*උදා විය ගනඳුඅරට තරිඳුව*
*උදාර වූ කිතු සමිඳු මෙදියත"*
යන්න මේ සමයේ මා අතින් ලියැවුණ ගීතයකි.

ස්වභාව සෞන්දර්යයේ රස විඳ ගනිමින් කඳුකරය ඔස්සේ ගම්දොර නත්තල් පහස ලද අතීත සැමරුම් මෙයින් නිමා කරකමි.

සුනිල් සරත් පෙරේරා
*ශ්‍රී ලංකා*